ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
|---|---|
| දිනය | **2017 දෙසැම්බර් මස 14 වැනි දින** |

## ශ්‍රී ලංකා මහ බැංකුවේ දසවැනි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව

ශ්‍රී ලංකා මහ බැංකුවේ දසවැනි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව 2017 වසරේ දෙසැම්බර් මස 08 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුවේ ජෝන් එක්ස්ටර් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වීය. මෙම සමුළුව, ප්‍රතිපත්ති සම්පාදන සහ අධ්‍යාපන ආයතනවල පර්යේෂකයන් සඳහා තම අත්දැකීම් සහ අදහස් ඉදිරිපත් කිරීම සඳහා සංසදයක් සකස් කර දෙන අතරම, මෑත කාලීන සාර්ව ආර්ථික ප්‍රතිපත්තිමය ගැටලු පිළිබඳ නව්‍ය පර්යේෂණ සිදු කිරීම දිරිගැන්වීම අරමුණු කර ගනිමින් “දීප්තිමත් අනාගතයක් සඳහා වූ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ” යන තේමාව යටතේ පවත්වනු ලැබීය.

පෙර වසරවල දී මෙන්ම, දසවැනි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව සඳහා ලොව පුරා මහ බැංකු, පර්යේෂණ ආයතන සහ නම් දැරූ විශ්ව විද්‍යාල නියෝජනය කරමින් කීර්තිමත් පර්යේෂකයන් රැසක් සහභාගී විය.

මෙවර සමුළුවෙහි ප්‍රධාන දේශනය, ඕස්ට්‍රේලියානු අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශිෂ්ට පර්යේෂකයකු වන, ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලයේ විශ්‍රාමලත් මහාචාර්ය කීත් හවුටන් මහතා විසින් පවත්වනු ලැබීය. බදු ගෙවන්නන් වැය කළ මුදල් සඳහා වටිනාකමක් ලබා දීමේ අරමුණ ඇතිව රජයේ වියදම් භාවිත කළ යුතු බව මහාචාර්ය

හවුටන් සිය දේශනයේ දී අවධාරණය කළේය. රජයේ විශ්ව විද්‍යාල සඳහා වන රජයේ වියදම්, සාක්ෂි මත පදනම් වූ නව්‍ය ක්‍රමවේද උපයෝගී කර ගනිමින් වඩාත් කාර්යක්ෂමව සිදු කළ යුතු බව ඔහු තවදුරටත් අවධාරණය කළේය.

සමුළුවේ සමාරම්භක දේශනය ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා විසින් පවත්වන ලදී. සමුළුව අමතමින්, සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ශක්තිමත් රාමු වැඩිදියුණු කිරීමේ වැදගත්කම සහ නීතිමය පනත් මගින් එම රාමු ආයතනගත කිරීමේ වැදගත්කම අධිපතිතුමා මෙහිදී අවධාරණය කළේය. එමෙන්ම, ආදායම් පාදක කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවකට නැඹුරු වීමේ ක්‍රියාවලියෙහි වැදගත්කම මෙන්ම මහ බැංකුවෙහි වගවීම සහ ස්වාධීනත්වය ගොඩනැගීමේ වැදගත්කම ද මෙහිදී ඔහු අවධාරණය කළේය. තවද, බාහිර ස්ථායීතාව ශක්තිමත් කිරීම සඳහා නම්‍යශීලී විනිමය අනුපාතිකයක් පවත්වාගෙන යෑමේ වැදගත්කම මෙන්ම රාජ්‍ය ණයෙහි තිරසාර බව ළඟා කර ගැනීම සඳහා රාජ්‍ය වගකීම් කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවය ද පෙන්වා දෙන ලදී. එසේම, තිරසාර ආර්ථික වර්ධනය සහ සේවා නියුක්ති අවස්ථා උත්පාදනය සඳහා ශක්තිමත් සාර්ව ආර්ථික මූලධර්ම පමණක් නොව ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ද අත්‍යවශ්‍ය බව ඔහු පෙන්වා දෙන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි සහකාර අධිපතිවරුන් වන එස්. ගුණරත්න මහත්මිය සහ එච්.ඒ. කරුණාරත්න මහතා විසින් සමුළුවෙහි තාක්ෂණික සැසි දෙකෙහි මුලසුන හොබවන ලදී. මෙම තාක්ෂණික සැසිවල දී සාර්ව ආර්ථික ගැටලු සහ මූල්‍ය අංශයේ ගැටලු පිළිබඳව ඕස්ට්‍රේලියාව, ප්‍රංශය, ජර්මනිය, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව යන රටවල් නියෝජනය කරමින් පැමිණි පර්යේෂකයන් මෙන්ම, ශ්‍රී ලංකා මහ බැංකුවේ පර්යේෂකයන් විසින් පර්යේෂණ පත්‍රිකා අටක් ඉදිරිපත් කරන ලදී. දේශීය සහ විදේශීය විශ්ව විද්‍යාල, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනය සහ රටේ පිළිගත් පර්යේෂණ ආයතනවල සාමාජිකයන්ගෙන් සමන්විත කීර්තිමත් බාහිර ඇගයීම් මණ්ඩලයක් විසින් මෙම පර්යේෂණ පත්‍රිකා තෝරා ගනු ලැබීය. හොඳම පර්යේෂණ පත්‍රිකාව සඳහා පිරිනමන ආචාර්ය ඩී.එස්. විජේසිංහ අනුස්මරණ සම්මානය ශ්‍රී ලංකා මහ බැංකුවේ/බටහිර ඕස්ට්‍රේලියානු විශ්ව විද්‍යාලයේ හර්ෂ පරණවිතාන මහතා විසින් ඉදිරිපත් කරන ලද "The Transition from Exchange Rate Targeting : The Case of Sri Lanka" යන පර්යේෂණ පත්‍රිකාව සඳහා හිමි විය.

**ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ ඡායාරූප කිහිපයක්**



*ඉදිරිපෙළ වමේ සිට:* ආචාර්ය චන්ද්‍රනාත් අමරසේකර මහතා (අතිරේක අධ්‍යක්ෂ, ආර්ථික පර්යේෂණ සහ පර්යේෂණ උපදේශක කමිටු සභාපති), ආචාර්ය යූතිකා ඉන්ද්‍රරත්න මහත්මිය (අධ්‍යක්ෂ, ආර්ථික පර්යේෂණ), කේ ඩී රණසිංහ මහතා (නියෝජ්‍ය අධිපති), මහාචාර්ය කීත් හවුටන් මහතා (ප්‍රධාන දේශක), ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා (අධිපති), සී ජේ පී සිරිවර්ධන මහතා (නියෝජ්‍ය අධිපති) සහ ස්වර්ණා ගුණරත්න මහත්මිය (සහකාර අධිපති)

*පසුපෙළ වමේ සිට:* මහාචාර්ය යනික් ලූකොට් මහතා (ඕර්ලීන්ස් විශ්ව විද්‍යාලය), ඩබ්ලිව් ඒ දිල්රුක්ෂිනී මහත්මිය (අතිරේක අධ්‍යක්ෂ, ආර්ථික පර්යේෂණ), මහාචාර්ය සිරිමල් අබේරත්න මහතා (කොළඹ විශ්ව විද්‍යාලය), ආචාර්ය යශෝධා සේනාධීර මහත්මිය (ශ්‍රී ලංකා මහ බැංකුව), මහාචාර්ය ගුන්තර් රේමේ මහතා (ඩැම්ස්ටැඩ් තාක්ෂණ විද්‍යාලය), ආචාර්ය බාඕ නුගුයෙන් මහතා (ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලය), ආචාර්ය ජනක මහීපාල මහතා (ශ්‍රී ලංකා මහ බැංකුව), හර්ෂ පරණවිතාන මහතා (ශ්‍රී ලංකා මහ බැංකුව/බටහිර ඕස්ට්‍රේලියානු විශ්ව විද්‍යාලය) සහ මනෝරන්ජන් සහූ මහතා (ඉන්දියානු තාක්ෂණික ආයතනය - මැඩ්‍රාස්)

**මහාචාර්ය කීත් හවුටන් මහතා ප්‍රධාන දේශනය සිදු කරමින්:**



**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති, ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා සමාරම්භක දේශනය සිදු කරමින්:**

